Department of
Social Statistics,
University of
Kelaniya
DOSS_2012/2013
SS/2012/0722

# ග්‍රාමීය කාන්තාවගේ සේවා නියුක්තිය කුටුම්බ ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (කෑගල්ල දිස්ත්‍රික්කයේ සියඹලාවල ග්‍රාම නිලධාරි වසම ඇසුරෙන්)

**එම්.ඩී.එම්.උබේසේන**

**සංක්ෂේපය**

වර්තමාන සමාජය තුළ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු අංශවල සේවාවන්හි නිරත වන අතර මෙහි දී කාන්තාව විසින් සැලකිය යුතු දායකත්වයක් ලබාදෙනු ලැබේ. විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ සමාජය වෙනස්කම්වලට ලක්වීම හේතුවෙන් සෑම අංශයක් ම කාන්තාව සඳහා විවෘත විය. අදවන විට නාගරික, ග්‍රාමීය, වතු යන අංශ තුනේ ම කාන්තාවන් බහුල වශයෙන් විධිමත් හා අවිධිමත් අංශයන්හි සේවාවන්හි නිරතවේ .කාන්තාවගේ සේවා නියුක්තිය ඔවුන්ගේ කුටුම්බ කෙරෙහි විවිධ අයුරින් බලපානු ලබන අතර කාන්තාවගේ ආදායම ගෘහාශ්‍රිතව බලපෑමට ලක්ව ඇත. එම නිසා කාන්තා සේවා නියුක්තිය කුටුම්බ ආර්ථිකය කෙරෙහි කවර අයුරින් බලපා තිබේද? යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වේ. මෙම ගැටලුව මත පදනම්ව ග්‍රාමීය කාන්තාවගේ සේවා නියුක්තිය කුටුම්බ ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මේ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියඹලාවල ග්‍රාම නිලධාරි වසම ආශ්‍රයෙන් ග්‍රාම නිලධාරී ගෘහ ලේඛනය භාවිතා කරමින් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ මෙම මුළු පවුල් සංඛ්‍යාවෙන් නියැදි ඒකක 50ක් තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව, බහුගුණ ප්‍රතිපායනය හා විචලතා විශ්ලේෂණ ආකෘති විශ්ලේෂණ ක්‍රමය යොදාගෙන ඇත. ග්‍රාමීය කාන්තාවන්ගේ සේවා නියුක්ත තත්ත්වය පිළිබඳ සලකා බැලීමේ දී ග්‍රාමීය කාන්තාවන් ගෙන් බහුතරයක් කුමන හෝ අංශයක රැකියාවල නියුක්ත වන බව සොයා ගත හැකිවිය. පර්යේෂණයට අනුව කාන්තාවගේ ආදායම් මට්ටම, මාසික ඉතුරුම් ප්‍රමාණය, කාන්තාවගේ රැකියාව යනාදිය කුටුම්බ ආර්ථිකය කෙරෙහි බලපාන බව සොයා ගත හැකිවිය. එමෙන්ම සේවා නියුක්තිය කාන්තාව තම ආදායම කුටුම්බ අවශ්‍යතා වෙනුවෙන් යොදවන බවත්, ලැබෙන ආදායම අනුව වියදම් සිදුකරන ප්‍රමාණය වෙනස්බව හඳුනාගත හැකිවිය. ඒ අනුව, කාන්තා සේවා නියුක්තිය කුටුම්බ කෙරෙහි ආර්ථික වශයෙන් ධනාත්මක බලපෑම් ඇති කිරීම හේතුවෙන් ග්‍රාමීය කාන්තාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ආර්ථික විශේෂඥයින් යොදා ගෙන ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කළ හැකි සැලසුම් සකස් කිරීම හා එම සැලසුම් ප්‍රාදේශීය තත්ත්වයන්ට අනුකූල වන ආකාරයට සකස් කිරීමට කටයුතු කළ යුතුය බව මෙහි දී යෝජනා කරනු ලබයි.

**මුඛ්‍ය පද:** ***ග්‍රාමීය කාන්තාව, සේවා නියුක්තිය, කුටුම්බ ආර්ථිකය***

---

madusanka57ubesena@gmail.com